ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2006

ශ්‍රී ලංකාවේ නීති පිළිබඳ හැඳින්වීමක් – LWU 1411

කාලය - පැය තුනයි

---

දිනය: 2006 මාර්තු මස 21 වන දින　　　වේලාව: ප. ව. 1.00 සිට ප.ව. 4.30 දක්වා

---

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න
අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

1. බ්‍රිතාන්‍යයන් ලංකාවට පැමිණීමට පෙර පැවති නීති සම්බන්ධයෙන් ඔවුන් අනුගමනය කළ ප්‍රතිපත්තිය රෝම ලන්දේසි නීතිය ශ්‍රී ලංකාවේ මූල්බැස ගැනීමට මග පෑදීමට හේතු විය

   යටත් විජිත මූලධර්ම සහ ශ්‍රී ලංකාවේ ලන්දේසි ව්‍යවස්ථා සම්බන්ධයෙන් අධිකරණ ආකල්පය කෙරෙහි අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

2. මහනුවර වාසය කරන දිලිප විවෘත විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී උපාධිධරයෙකි. ඔහුගේ පියා උඩරැටියෙකු වූ අතර පහත රට කාන්තාවක් වූ දිලිපගේ මව සමග 1975 දී සාමාන්‍ය නීතිය යටතේ විවාහ වී මහනුවර පිහිටි තම පාරම්පරික දේපලවල වාසය කළේය. පාරම්පරික උඩරට කාන්තාවක වන සිය පෙම්වතිය වූ දේවිකා සමග විවාහ වීමට දිලිප අදහස් කරයි. දෙදෙනාගේ විවාහය සඳහා දේවිකාගේ පියා අවසර දුන්න ද විවාහය උඩරට නීතිය යටතේ සිදු කළ යුතු බව ඔහු තරයේ කියා සිටී. තමාට අදාළ වන්නේ කුමන නීතිය ද යන්න සහ දේවිකා සමග තම විවාහය උඩරට නීතිය යටතේ සිදු කළ හැකි දැ යි දැන ගැනීමට දිලිපට අවශ්‍ය වේ.

   (අ) දිලිපට උපදෙස් දෙන්න.
   (ආ) දිලිපගේ දෙමාපියන් 1950 දී උඩරට නීතිය යටතේ විවාහ වූයේ නම් ඔබේ පිළිතුර වෙනස් වන්නේ ද?

3. රාසවන් ද්‍රවිඩ දෙමාපියන් යුවළකගේ පුත්‍රයෙකි. ඔහුගේ දෙමාපියෝ 1983 දී ඇතිවූ ජාතිවාදී කලබල නිසා කැනඩාවට ගොස් පදිංචි වූහ. ශ්‍රී ලංකා රජය සහ සටන්කාමීන් අතර සටන් නැවැත්වීමේ එකගතාවක් 1990 දී අත්සන් කිරීමෙන් පසුව රාසවන්ගේ දෙමාපියෝ රාසවන් සමග ලංකාවට ආපසු පැමිණ යාපනයේ පදිංචි වූහ. එවකට අවුරුදු 12 ක් වූ රාසවන් යාපනයේ පාසලකට ඇතුලත් කරන ලදී. කැනඩාවේ දී තමා ඉතිරි කර ගත් මුදල් යොදා රාසවන්ගේ පියා යාපනයේ නිවසක් ඉදි කළ අතර 1996 දී රාසවන්ට අවුරුදු 18 සම්පූර්ණ වූ දිනයේ දී එම දේපළ රාසවන්ට තෑගී කළේය. යාපනයේ වෛද්‍ය පීඨයේ අධ්‍යාපනය නිම කිරීමෙන් පනු රාසවන්ට 2000 දී මඩකලපුව රෝහලේ පත්වීමක් ලැබුණි. මඩකලපුවේ ද්‍රවිඩ කාන්තාවක වූ ශශිකලා සමග විවාහ වූ රාසවන් ඇය තම නිවසට කැන්දාගෙන ගියේය. අවස්ථාවක් ලද සැම විටම ඔහු තම බිරිඳ හා දරුවා බැලීමට ගියේය. පෞද්ගලික ප්‍රතිකාර

මගින් විශාල මුදලක් උපයා ගත් රාසවත් එයින් මඩකලපුවේ ඉඩමක් මිල දී ගත් අතර එහි රෝහලක් ඉදි කිරීමට අපේක්ෂා කළේය. කෙසේ වුව ද 2005 දෙසැම්බර් මාසයේ දී විරුද්ධවාදී සටන්කරුවන් අතර මඩකලපුවේ ඇති වූ වෙඩි හුවමාරුවකට මැදි වූ රාසවත් මිය ගියේය. රාසවත්ට අදාල වන්නේ කුමන නීතිය දැ යි දැන ගැනීමට ශශිකලාට අවශ්‍ය වේ.

ශශිකලාට උපදෙස් දෙන්න.

4. “මුස්ලිම් නීති සංග්‍රහය නිශ්ශබ්ද වන විට දී සහ යම් කරුණක් සම්බන්ධයෙන් අදාල වන විශේෂ සිරිතක් නොමැත්තේ නම්, විශේෂ නීතියක් නොමැති අවස්ථාවල දී සාමාන්‍යයෙන් අදාල වන නීතිය වශයෙන් රෝම ලන්දේසි නීතිය කෙරෙහි යොමු විය යුතු ය” - අබ්දුල් රහිමාන් එ උසාන් උම්මා (1916) 19 න. නි. වා. 175 නඩුවේ දී ජනයිදර් වි. 184 පිටුවේ දී.

1931 දී මොහොම්මදීය නීති සංග්‍රහය අහෝසි කරන තෙක් පැවති තත්ත්වය මෙම අධිකරණ වාචිකයෙන් පිළිබිඹු වන්නේ දැයි විවේචනාත්මක ව සාකච්ඡා කරන්න.

5. “අපේ ශිෂ්ඨාචාරය තුළ උද්ගත වන්නා වූ නව තත්ත්වයන් සම්බන්ධයෙන් අපට උරුම කර දී ඇති නෛතික මූලධර්ම වර්ධනය කිරීමට අපට හිමිකමක් ඇතැයි මම සිතමි. එම මූලධර්ම දැඩිලෙස එයාකාරයෙන්ම අදාල කරනවාට වඩා යුක්තිසහගත ලෙස අදාල කළ යුතු වේ.” මධ්‍යම පළාතේ රජයේ දිසාපති එ. ලෙව්විමාන් මෙට්ටි (1922) 24 න නි වා 36 නඩුවේ දී බර්ට්‍රම් අ වි 41 වන පිටුවේ දී.

රෝම ලන්දේසි නීති මූලධර්ම අදාල කරමින් නඩුකියන්නන්ගේ ගැටලුවලට විසඳුම් ලබා දීමේ අධිකරණ ප්‍රතිපත්තිය ආශ්‍රයෙන් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

6. ශ්‍රී ලංකා නීති ක්‍රමය තුළ බහුවාදය පිළිබඳ ගැටලු ඉස්මතු වන අවස්ථා සාකච්ඡා කරමින් අප නීති ක්‍රමය තුළ නීති ගැටුම් තත්ත්වයන් ඇති වීම අවම කිරීම සඳහා කළ යුතු ප්‍රතිසංස්කරණ නිර්දේශ කරන්න.

7. බ්‍රිතාන්‍යයන් විසින් උඩරට රාජධානිය අල්ලා ගැනීමට පෙර එහි සිටි අධිකරණ නිලධාරීන් හා පැවති ආයතන සහ ඔවුන් ක්‍රියාත්මක කළ අධිකරණ බලතල විස්තර කරන්න.

8. පහත සඳහන් ඒවායින් ඕනෑම දෙකක් පිළිබඳ සටහන් ලියන්න.

(අ) ද්වි විවාහය නම් සංකල්පය සම්බන්ධයෙන් අධිකරණ ආකල්පයේ විකාශය
(ආ) 1806 මොහොම්මදීය නීති සංග්‍රහයේ ආරම්භය හා අන්තර්ගතය
(ඇ) බහාවියානු ව්‍යවස්ථා පිළිබඳ අධිකරණ ආකල්පය
(ඇ) තේසවලමෛයි නීතිය යටතේ පූර්වක්‍රය